# නිර්මාණ Nirmana

## අනුබුදු මිහිඳු හිමි නමදිමු

පුන්සඳ පොසොන් පෝ දා ලොව අඳුර මුදා
රන්තරු පිරිවරා බැබළුණි කැළුම් විදා
පෑ තිසු නිරිඳු දුනු හී තල සුරත රඳා
නික්මුණි දඩයමට සහ පිරිවරින් එදා

බුදු හිමි උපන් දඹදිව් තලයෙම ඉපිද
දම් සෝ නිරිඳු පුත් අරහත් පදවි ලද
පිය රජ ඇරයුමින් සිරිලක වඩින ලෙද
වැඩියෝ ලකට කුළුනින් වැනි දිනක අද

අනුබුදු මිහිඳු හිමි එලෙසින් වැඩම කර
රජු හා පිරිස බුදු දහමට නැඹුරු කර
පහදා දුන් නිසා සිරි සදහම් පවර
දම් දිවයිනැයි සිරිලක නම්විය එවර

ඔබ ඇරයුමෙන් හා පැතිස් රජුගෙ පැතුම්
සලකා මෙහෙණි සහමිත් පා නොමඳ විකුම්
සිරිමා බෝ රජුන් එහි වැඩමවා උතුම්
ඉටු කළ අමිල සේවය බැතියෙන් සමරම්

මෙත් කරුණා ගුණෙන් හදවත් පුබුදු කර
දුක් පිරි සසර සයුරින් වෙන්නට එතෙර
පෙන්වා ලක් දනට සිරි සදහම් පහුර
වැඩ සිටි සේක සිරිලක, මව්බිම අතැර

ඔබ වැඩ සිටිය ඒ සුපතල මිහින් තලේ
සුවහස් විදුලි බුබුලින් එකළුව බැබළේ
සැදැහැති දනන් නෙක පින්කම්වල නියැලේ
මුළු සිරිලකම හිමි අද ඔබ නමින් දිලේ

*විශ්‍රාම ලත් විදුහල්පතිනි*
♦ ***ප්‍රේමා අදිකාරි***
Morden Surrey **UK**

## යළිත් මිහිඳු හිමි වැඩියා නම් !

පොසොන් සඳේ සඳ රැස් දහරේ මම
දෙනෙත් පියාගෙන හිඳින්නෙමී
මිහින්තලා ගල මහින්ද හිමි සඳ
මගෙ රට දැය ගැන සිතන්නෙමී

දුනු හී අරගෙන පැතිස් නරනිඳු
මුවන් අහිංසක මරන ලෙසින්
රජ පිරිවර සහ එකතුව දිව්වා
කැලෑ රොදේ සැරි සරන තොසින්

තිස්ස! තිස්ස! උස් හඬ පැතිරෙන විට
බැලුවා මහ රජු උරණ වෙලා
මිහින්තලා ගල මුදුණේ සිටියා
මිහිඳු සමිඳු සහ පිරිස බලා

අසන අසන අඹ පැනයට පිළිතුරු
දෙමින් නුවණ විදහා පෑවා
අපේ රජතුමා දුනු හී බිම දා
බුදු දහමට අවනත වූවා

මගෙ සිරිලක් බිම දහම් දීපයක්
කරමින් සහ පරපුර හැදුවා
විහාර දාගැබ් කලා ශිල්ප නෙක්
දහසක් දේ අපහට බෙදුවා

යහගුණ දහමද සමගිය සතුටද
සිරිලක දස අත පැතිර ගියා
බදු බණ හද තුළ පුරවා ඉන් පසු
හෙළ දෙස රැස දියුණුවට ගියා

අද කෝ සාමය කොතැනද සැනසුම
යුද ගිණි දස අත ඇවිළෙන්නේ
මගේ දහම් දිවයින තුළ ඉඳගෙන
මලක් පුදන සිත පෑරෙන්නේ

පොසොන් සඳේ සඳරැස් දහරේ මම
දෙනෙත් පියාගෙන සිතන්නෙමී
තවත් මිහිඳු හිමි කෙනෙක් නුදුරු දින
වඩින්න කියලා පතන්නෙමී

♦ ***ප්‍රේමා එස්. රූපසිංහ***
නුගේගොඩ **Sri Lanka**

## අනුබුදු හිමි නමදිමි

අදවන් දින උදාවූ පුන් පොහොය පොසොන්
වඩිමින් සිරිලකට මිතුදම රකින ලෙසින්
ගෙනදුන් දහම් රස නැණ ගුණ වඩන සිතින්
බැතියෙන් හිස නමමි අනුබුදු මිහිඳු නමින්

♦ ***ජෙනට් සුහවික්‍රම - ගම්පහ***



## පොසොන් මහිමය

පොසොන් සඳින් බබළන උඩු ගුවනේ
ර සි න් පිරුණ බණ වැකුණිය සවනේ
ම හි න් ද හිමි හැරදුණි දොර නිවනේ
ප හ න් ව වැතිරෙමි හිමි ඔබ සෙවනේ

හි මි ගු ණ පැතිරුණ මෙම මුළු දෙරණේ
තැනතැන බැඳි රැස් විහිදෙන තොරණේ
අ ප ම ණ ඉතිරෙයි අනුබුදු වරුණේ
ලැබගෙන සැනසෙති ඔබ පිළි සරණේ

රුදු තද සිත් දස කුසලෙහි යෙදුණේ
ජන හද වත් පවු මළයෙන් මිදුණේ
බැති පුද දෙනුවස් ගී පද බැඳුණේ
හිමි සඳ දිලි හින්දයි ගිරි මුදුනේ

හෙළ සාහිතයට නව පණ පෙවුනේ
ග ල තුළ අපමණ බුදුගුණ කැවුනේ
මි ල නොකලැකි බිතු සිතුවම් මැවුනේ
ම ළ බැඳි ගත සිත මළකඩ යැවුනේ

දු නු ඊතල වෙත ගිය අත ඇදුනේ
උණු වූ හද දම් සිසිලස වැදුනේ
තු නු රුවනට මුළු සිරිලක බැඳුණේ
අ නු බුදු හිමි හින්දයි අප මිදුණේ

ශාස්ත්‍රපති
♦ ***මිගස්තැන්නේ රතනජෝති හිමි***
සුනන්දාරාමය ගම්පහ **Sri Lanka**

## අනුබුදු හිමි නමදිමි !

බුදුගුණ කියන විට මතුකර අම සුවම
ඒ වැනි සැපක් නැත මට මේ මුලුළු ලොවම
හිමි නොදෙසුවා නම් සුලු ඇත්පද උවම
මා කැලයෙහි වෙසෙන ගල් වැද්දෙකි තවම

රුව නොදුටුවත් හිමිගේ වැනි ඇසට අඳුන්
වැටහේ මගෙ ළයට ඔබ ගුණ සුවඳ සඳුන්
අනුබුදු නොවේ මගෙ හිමි සිරිලකට බුදුන්
මිය යන තුරුම මගෙ හිස මල්කඩකි මුදුන්

වෙස්ගෙන මොහොතකට රන් සමනලෙකු හිමී
සිරිපා පියුම් රොන් ඇදගනු පිණිස එමී
පෙරුමන් පුරා බිඳ මතු ගිහිගෙදර බැමී
මේ සංසාර සාගරයෙන් එතෙර වෙමී

♦ ***කරගම්පිටියේ ජයවංශ පෙරේරා***

## පොසොන් සිතුම්

සිරිලක් දිවයින සරා
නව යුගයක් කළ උදා
පුදමු පුදමු බැති පෙමින්
අනුබුදු හිමි සිරි දෙපා

සහ පරපුර බිහිවුණේ
මෙත් කරුණා පැතිරුණේ
සමිඳුනි ඔබගේ ගුණේ
ගයමු ගයමු අද දිනේ

අඹ දළු සුළඟට වෙලී
ඔබ රුව මවමින් හිඳී
මිහින්තලා නුබ ගැබින්
සඳරැස් ඔබ පා සිඹී

♦ ***කුමුදු රොහාන් අමරසිංහ***
Wood Green, **London**

## පොසොන්

රසෙන් දහම්
සිත් මෙත්
සිසිලසින්
වෙළේ
ගසෙන්
වැලෙන් පිපි
කුසුමින්
පවන් සැලේ
බසෙන් නිහඬ
ගී ගොතමින්
නිසන්සලේ
පොසොන්
තරිඳු නුබ
හිනැහෙයි
මිහින්තලේ

♦ **DAREN**
**London**

# පොසොන් ගී

**අදයි සුපින්වත්**
**මහින්ද මා හිමි**
**වැඩි පොසොන් පෝ දා**

වැදේ සුගන්ධේ - වෙළී සුළං රැල්
පිපී රම්‍ය මාලා
මිහින්තලාගල - දෙසින් පෙනේ
ෂඩ් වර්ණ රශ්මි දහරා

බුදුන් දහම් සිසිලේ
ගිලේ ගිලේ ලංකා
අදයි සුපින්වත් - මහින්ද මා හිමි
වැඩී පොසොන් පෝ දා

පින්බර මේ සෝබා
උතුම් පොසොන් පෝ දා
සිංහල ජාතිය - සම්බුදු ධර්මය
දිනේ සදා ලංකා

***ගායනය -***
***මාලතී පැට්‍රිෂියා ද මෙල්***

## පායන් පොසෝන් සඳ

මී අඹ සුවඳ පැතිරුණු
දම් දහර ගලා ගිය
මනු සිත් සුවපත් කළ
පායන් පොසොන් සඳ හෙළයට

දැල්වෙන පහන් සිල
එළිය කරනා නිවන් දොර
කරුණාහරිත මල් පිපුණ
පායන් පොසොන් සඳ හෙළයට

වඩ්දිය බාදියට
හැලෙන්නට පුරණ පෙරුම්
ගැබ්බර අහස් කුස
පායන් පොසොන් සඳ හෙළයට

කෙත් වතු සරු වන්නට
සාදු හඬ සවන රැව් දෙන්නට
තුන් හෙළය එකලස් වන්නට
පායන් පොසොන් සඳ හෙළයට

♦ ***සපුමල් බණ්ඩාර ද අල්විස්***
**London**

## මා හද බැති පුද!

ගස් උඩ සුදුමල්, අත් උඩ සුදුමල්
හැමතැන සුදුපාටකි ඇත්තේ
මිස්සක අරණම දසසිල් අරගෙන
සුදු පිරුවට පොරවා ගත්තේ

සදහම් මිණිකැට එළියෙන් මිසදිටු
ගණඳුර පැන්නූ ලක් පියසේ
අනුබුදු හිමි ගුණ සමරා වන
දෙවියොත් සුදුපිරුවට එළති මෙසේ

බැතිමත් හදවත් අතරින් මතුවී
සුළඟේ පාවෙන බැති ගීයෙන්
රසවත් වී වන විහඟුන් යළි එය
දස අත පතුරති රස ගීයෙන්

අනුබුදු සිරිපද නළලත සදමින්
බැති උපහාරය කරමු නැමී
පිරිසිදු බව පිරි මගෙ හදවත
ගඳ කිළියක් වේවා ඔබට හිමී

♦ ***සිරිපාල කඳුමුල්ල***
**Sri Lanka**

## දම් රස මිහිර

පැතිස් නිරිඳු මිස්සක වන පෙතට වැදී
එළවා දුවද්දී මුවෙකුට දෙනෙත ඇදී
තිස්ස ය කියා ඇමතූ හඬ සවන රැඳී
සතුටකි එදා දුනු හී බිම තැබුණු විදී

පෙන්නා අඹ ගසක් ඒ ගැන කරුණු අසා
රජුගේ නුවණ වටහාගෙන දහම දෙසා
මිසදිටු අඳුර එදවස දුරු කැරුණු නිසා
එළියෙන් එළිය වී සිරිලක සතර දිසා

උත්තම මිහිඳු හිමි දෙසූ දම් සවන වැටී
සෙත් සිරි සැදී පව් මළ පිස දැමුණු හැටී
මෙත් කරුණා දයා සිහිලැල් පවන ගැටී
සත්වග සැනසුණේ බවදුක් කතර සිටී

දන හද නිවා හරවා තිසරණය කෙරේ
සැනසෙන හැටි දෙසා නිමකොට සසර පොරේ
මන බැඳි නිවන් පුරයට දොර විවර කෙරේ
අනුබුදු සමිඳු දෙසූ දම්රස මිහිර පෙරේ

♦ ***ලීලා විජේසූරිය***
*අම්බලන්ගොඩ* **Sri Lanka**

## පොසොන් සඳේ !

නුබ ගැබ සිනාසී සිත සිසිලක් රන්දා
අ ඹ තුරු අතු මතින් එබිලා සුව වින්දා
සි ඹ සඳ දියෙන් දස අත සණඳුර බින්දා
සු බ සිහිනයක් මගෙ සිත වටකර ඇන්දා

පෙරදා නිරිඳු පෑ තිස් අවි දරා හිඳ
වි ස දා මුවාගේ ඉරණම දිවෙන සඳ
ප හ දා අමා දම් නිරිඳුන් සවන විද
දෙසුදා සඳේ නුඹගේ මතකයට එද

මුණිඳු ගුණ නොදැන ගස් ගල් පිදුව රට
අ වි දු අඳුර වෙත ජනයින් ඇදෙනු දුට
මි හිඳු සමිඳු වැඩ දම් පද දෙසන විට
සු සුදු සිතින් නුඹ ඇසුවෙද සතුට පිට

එ දවස් වගේ රැස් විහිදා අහස මත
අ ද ට ත් පොසොන් සඳ පායා දිලෙනු ඇත
බැඳසිත් සතන් හෙට දිනයෙත් නැගී එත
ක ව ද ත් නුඹේ සිසිලස අඩුවකුත් නැත

මි හින් තලා කඳු පාමුල සිහිල සැදේ
සි හි න් සුළඟෙ සුදු අරලිය සුවඳ රැදේ
ම හින් ද මා හිමි දෙසූ දම් සිතෙහි ඇදේ
කියන් එ දම් මිනිසුන් හට පොසොන් සඳේ

♦ ***දුලාංජලී සිරිවර්ධන***
**නීති පීඨය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

## කෝ බණ පිළිපදින දන ?

ඔබ බුදු සසුන පිහිටෙව් පසු සිහල බිම
දම් දිවයිනැයි සුපතල විවිය රටෙහි නම
එනමුත් සමිඳ දැන් මෙහි ඇති දහම කිම
තිරිසන් වැඩ තිබේ බැලූ බැලූ අතම හැම

මිනිසුන් මැරුම බල්ලන් මරණ ගානය
මානව දයා ගුණ දන හදෙහි හීනය
බණ පින්කම් පලෙත් මත නැගෙන පානය
රට වැසි දනගෙ ගති දින දිනම දීනය

ගුවන් විදුලි බණ රූවාහිනියෙ බණ
හැම පන්සලම බණ පත්තරයෙහිද බණ
අතනත් මුණිගෙ බණ මෙතනත් මුණිගෙ බණ
සමිඳුනි එහෙත් කෝ බණ පිලිපදින දන?

පැතිස් නිරිඳු යුගයෙහි ඔබ වැඩිය දින
තිබු ගුණ දහමවත් දැන් නැත මේදිව යින
මේ විපතින් මුදා රක්නට සියළු දෙන
සමිඳුනි අනේ නැවතත් මෙහි වඩිනු මැන

♦ ***කලාභූෂණ කටුවාමුල්ලේ ජිනදාස***

## Listen to the cries!

For hundreds of thousands of years
The stew in the pot
Has brewed hatred and resentment
That is difficult to stop.

If you wish to know
Why there are disasters
Of armies and weapons in the world,
Listen to the piteous cries
From the slaughterhouse at midnight.

♦ **A Chinese verse**

## අසනු මැන මේ හැඬුම් !

සියක් දහස් වස් ගණනක් තිස්සේ
මස් ඇතිළිය ඇත ලිප උඩ ඇවිළෙන
වෛර කේන්තිය පැහි පැහි උතුරයි
නවතන්නට බැරි කිසි ලෙස කිසි දින

දැනගනු රිසි නම් ඇයිද ලොවෙහි අද
ආයුධ ලෙළවන විපත්ති ව්‍යසන
අසන්න ! මැදියම හද කම්පා කොට
මස් මඩුවෙන් එන වියරු ලතෝනිය

♦ **චීන කවියක්**